**ISBN 978- 955-4563- 71- 1**

# ශ්‍රී ලංකාවේ අභිලේඛනවල සඳහන් භාෂාවෙන් හෙළිවන උත්තර දේශය සමඟ පැවැත් වූ සම්බන්ධතා පිළිබඳව පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

**නිලන්ති බණ්ඩාර**
**පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය**

**සංක්ෂිප්තය**

***කිසියම් රටක ජීවත් වන ජනතාවට තම ස්වදේශීකත්වය හා අනන්‍යතාවය තහවුරු කර ගැනීමට ඉතිහාසය වැදගත් වේ. එහිදී පුරාවිද්‍යාත්මක සාධකවලට හා වාග් විද්‍යාත්මක සාධකවලට හිමිවන්නේ විශේෂ වැදගත්කමකි. ශ්‍රී ලංකාවේ ව්‍යවහාර කෙරෙන සිංහල භාෂාවේ ප්‍රභවය ඉරාණීය භාෂාවල බලපෑමට ලක් වූ උප භාෂා කිහිපයකින් සමන්විත, වයඹදිග ඉන්දු ආර්ය ප්‍රාකෘත හා බටහිර ඉන්දු ආර්ය ප්‍රාකෘත සමඟ අඩු වැඩි වශයෙන් සම්මිශ්‍රණය වීමෙන් සිදු වී තිබේ. එසේම ද්‍රවිඩ භාෂා ලක්ෂණ ද පසුකාලීනව භාෂාවට එකතු වී තිබේ. මෙකී කරුණු ශ්‍රී ලංකාවේ මුල් කාලීනව රචිත අභිලේඛනවලින් පැහැදිලි වෙයි. භාෂාවක වාක්‍ය වින්‍යාසය, වාග් විලාසය හා ශෛලීය බොහෝවිට කාලයෙන් කාලයට වෙනස් වෙයි. මීට පොදු භාෂක සමාජයේ සංස්කෘතික මට්ටම, වෘත්තිය විෂමතා හා සමාජ තත්ත්වය, පෞද්ගලික රුචිකත්වය හා හැකියාව ආදී කරුණු බලපායි. මේ අන්දමට භාෂාවක සිදුවන පරිණාමය හඳුනාගත හැකිය. ඒ සඳහා ක්‍රිස්තු පූර්ව තුන්වන සියවස සිට ක්‍රිස්තු වර්ෂ නමවන සියවස දක්වා කාලයට අදාළ අභිලේඛනවල සඳහන් වචනවල නිරුක්ති සංඛ්‍යාත්මකව විශ්ලේෂණය කිරීමෙන් ක්‍රිස්තු පූර්ව තුන්වන සියවස සිට ක්‍රිස්තු වර්ෂ තුන්වන සියවස දක්වා උතුරු හා මධ්‍ය ඉන්දීය බලපෑම මුල් කාලීනව මෙරටට ලැබුණ බව පෙනේ. මෙකී සාධිත කරුණු පුරාවිද්‍යාත්මකව ද තහවුරු වී තිබේ.  ඒ අනුව ව්‍යවහාර භාෂාව මගින් සිංහල සංස්කෘතියේ සිදු වූ විවිධ වෙනස්කම් හඳුනා ගැනීමට හැකි වෙයි.***

## හැඳින්වීම

ඉපැරණි අතීතයට අයත් සාධකයක් හෝ යම් කිසි දත්තයක සත්‍යතාවය රඳා පවත්වා ගැනීමට එකී සාධකයන් තහවුරු කිරීම වැදගත් වේ. ක්‍රිස්තු පූර්ව තුන්වන සියවස සිට ක්‍රිස්තු වර්ෂ නමවන සියවස දක්වා කාලයට අයත් ශ්‍රී ලංකාවේ රචිත අභිලේඛනවල ඇති නාම පද සහ ක්‍රියා පදවල දක්නට ලැබෙන තත්සම හා තත්භව වචන වෙන්කර සංඛ්‍යාත්මකව විමර්ශනය කිරීමෙන් මෙන්ම පාලි, සංස්කෘත හා ද්‍රවිඩ වචනවලින් නිරුත්පත්ති වූ පද වර්ෂ අනුව සංඛ්‍යාත්මකව පෙළගැස්වීමෙන් සිංහල භාෂාවේ විකාශනය සඳහා ඉන්දු ආර්ය භාෂාවලින් (පාලි, සංස්කෘත සහ දෙමළ) යම් පිටිවහලක් ලැබී ඇති බව පැහැදිලිවෙයි (වගු අංක 01). මෙකී සාධිතය පුරාවිද්‍යාත්මක සාධක ඇසුරෙන් සාකච්ඡා කිරීම මෙයින් සිදුවේ.

**වගු අංක 01: ක්‍රිස්තු පූර්ව තුන්වන සියවස සිට ක්‍රිස්තු වර්ෂ  නමවන සියවස දක්වා වූ කාලයට අයත් ලිපිවල සඳහන් වචන නිරුත්පත්ති වී ඇති භාෂා**

| | පාලි | සංස්. | දෙමළ |
|---|---|---|---|
| ක්‍රි. පු. 3 - ක්‍රි. පු. 1 | 652 | 215 | 5 |
| ක්‍රි. ව. 1 | 131 | 39 | 5 |
| ක්‍රි.ව. 1 හෝ 2 | 82 | 16 | 0 |
| ක්‍රි.ව. 2 | 269 | 68 | 1 |
| ක්‍රි.ව. 2 හෝ 3 | 29 | 7 | 00- |
| ක්‍රි.ව. 3 | 117 | 22 | 901 |
| ක්‍රි.ව. 3 හෝ 4 | 12 | 4 | 0 |

## පුරාවිද්‍යාත්මක සාක්ෂි ඇසුරෙන් විමර්ශනය කිරීම

ශ්‍රී ලංකාව ඉන්දීය උප මහද්වීපයට සමීපව, ඩෙකෑන් සානුවේ ශිඛරයේ පිහිටීම හේතු කොටගෙන, නිරන්තරයෙන් පෙර අපර දෙදිග මෙන් ම අරාබි රටවල නැව් ගමනාගමනයේ නැවතුම්පොළ ලෙස ප්‍රයෝජනයට ගත්තේය. එකී භූගෝලීය පිහිටීම මෙරටට බාහිර ලෝකය සමඟ වාණිජ හා

ISBN 978- 955-4563- 71- 1

සංස්කෘතික සම්බන්ධතා ගොඩනගා ගැනීමට මහගු තෝනැන්නක් විය. මෙකී භූගෝලීය පිහිටීම අනුව මුල් ම වාණිජ සහ සංස්කෘතික සම්බන්ධතා ගොඩ නැගුණේ ඉන්දීය උප මහද්වීපය සමඟ බවට පුරාවිද්‍යාත්මක සාධක හමුවී තිබේ.

**සිංහලයේ උතුරු ඉන්දීය බලපෑම**

ක්‍රිස්තු පූර්ව තුන්වන සියවස සිට ක්‍රිස්තු වර්ෂ තුන්වන සියවස තෙක් මෙරට දක්නට ලැබෙන අභිලේඛන දෙස බැලීමේදී සිංහල භාෂාවේ පරිණාමය සඳහා පාලි, පෛශාචි, මාගධී, අර්ධ මාගධී, ශෞරසේනි ආදී ප්‍රාකෘතවල බලපෑම ලැබී ඇති බව පෙනේ. මින් පැහැදිලි වන්නේ උතුරු, මධ්‍ය, නැගෙනහිර ඉන්දියාව සමඟ සම්බන්ධතා පවත්වා ඇති බවයි. මෙකී කරුණ පුරාවිද්‍යාත්මක සාක්ෂිවලින්ද සාධනයවේ.
ශ්‍රී ලංකාව උතුරු ඉන්දියාව සමඟ සම්බන්ධතා පැවැත් වූ බව ජනාවාසවීම පිළිබඳව සඳහන් ලිඛිත මුලාශ්‍රමය තොරතුරු අනුව පැහැදිලිවේ (ම.ව. 1994). ලක්දිව පළමුවෙන්ම ජනාවාසවීම පිළිබඳව ජනප්‍රවාදගත කථා පුවතේ පවා සඳහන්වන්නේ උතුරු ඉන්දියාවේ සිට පැමිණියවුන්ගෙන් පැවත එන බවයි. එමෙන්ම ඉන්දියාවේ සිට පැමිණි වෙළෙන්දන්ගෙන් ශ්‍රී ලංකාව පළමුවෙන්ම ජනාවාස වූ බව සමහර උගතුන්ගේ මතයයි. විජය කුමරු පවා වෙළෙන්දකුගේ පුතෙකු බව දිව්‍යාවදානය සඳහන් කරයි (ගුණසිංහ 1961: 177) මෙවැනි කරුණු මගින් පැහැදිලි වන්නේ ද උතුරු ඉන්දියාව සමඟ ශ්‍රී ලංකාව සම්බන්ධතා ගොඩනගා ගත් බවයි.
මුල් යුගයෙන් පසු එළඹෙන ඓතිහාසික යුගයේදී මෞර්ය වංශික අශෝක අධිරාජ්‍යයා හා දේවානම්පිය තිස්ස රජු අතර ඇති වූ නොදුටු මිත්‍රත්වය හේතුවෙන් මෙරටට බුදු දහම ලැබුණි. මේ නිසා ශ්‍රී ලංකාව උතුරු ඉන්දියාව සමඟ සංස්කෘතික, දේශපාලන සහ වාණිජ සම්බන්ධතා ගොඩනගා ගත්තේය.
එසේම ක්‍රිස්තු පූර්ව 3000 ටත් වඩා ඉපැරණි ඉතිහාසයක් ඇති ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ ජනයා නාගරික, සුඛෝපභෝගී ජීවිතයක් ගත කළේය. මෙම ජනතාවට අවශ්‍ය මුතු, මැණික්, පබළු ආදිය විදේශයන්ගෙන් ලබාගත් බව ඔවුන්ගේ දියුණු වරායන් ආශ්‍රිත කළ කැණීම් මගින් හෙළිවෙයි. ඒ අනුව ඉන්දු නිම්න වෙළෙඳුන් ශ්‍රී ලංකාව සමඟ ද සම්බන්ධතා පැවැත් වූ බවට තොරතුරු හමු වේ. මෙරට දක්නට ලැබෙන පූර්ව බ්‍රාහ්මී යුගයට අයත් අභිලේඛනවල හරප්පා සභ්‍යත්වයේ අක්ෂර සංකේතවලට සමාන බ්‍රාහ්මී නොවන සංකේත රැසක් හමුවීමෙන් ඒ බව සනාථ කරවයි. මෙවැනි අක්ෂරරූප විද්‍යාත්මක සාධක අනුව ඉන්දු නිම්න වැසියන්ගේ භාෂා ලක්ෂණවලට සමානකමක් දැක්වූ අක්ෂර ලිවීමේ ක්‍රමයක් මෙහි පැවති බව සිතිය හැකිය (Paranavitana 1970). මේ අනුව ශ්‍රී ලංකාවේ වයඹ හා ගිණිකොණදිග ප්‍රදේශවල මුල් ජනාවාස ඇති වූයේ ඉන්දු නිම්න වාසීන්ගෙන් බව ද සිතිය හැකිය (කල්‍යාණවංශ හිමි 1964: 9) මෙවැනි ලිඛිත හා අභිලේඛන සාක්ෂිවලට අමතරව මෙරටින් හමුවී ඇති මැටි බඳුන්වලින්ද ශ්‍රී ලංකාව උතුරු ඉන්දියාව සමඟ සම්බන්ධතා පැවැත් වූ බව හෙළි කරයි. අළු පැහැති මැටි බඳුන් (PGW) හා උත්තර දේශීය ඔප දැමූ කලාත්මක මැටි බඳුන්වලින් (NBPW) එකී සම්බන්ධතා පිළිබඳව තොරතුරු සනාථ කරයි (බෝපේආරච්චි 1997: 21).
ඉන්දියාවේ පැරණි මැටි බඳුන් අධ්‍යයනයෙහි උත්තර උද්දීප්ත කළු පැහැති මැටි බඳුන්වලට (Northern Black Polished Ware) හිමිවන්නේ වැඩි වැදගත් කමකි. මෙම බඳුන් ඉන්දියාවේ උතුරු හා මධ්‍යම ප්‍රදේශයට විශේෂිත වූ වර්ගයකි. මේවා ඉන්දියාවේ ගංගා නම් නිම්නය අවට ප්‍රදේශයෙන් බහුලව හමු වී තිබේ. එම ප්‍රදේශවල සිට මධ්‍ය දේශය දක්වා මෙම බඳුන් හමුවී ඇත්තේ ඉතා ස්වල්ප ප්‍රමාණයකි. වයඹ දෙසට ව්‍යාප්තවීම අවම මට්ටමකට පැවතුනි (Shrma 1953 : 18). නමුත් මෙකී බඳුන් ශ්‍රී ලංකාවේ බොහෝ ස්ථානවලින් හමුවී ඇත. අනුරාධපුර ගෙඩිගේ, ජේතවනාරාමය, මාන්තායි, තිස්සමහාරාමය, සීගිරිය, පොළොන්නරුව ඒ අතර කිහිපයකි. එමෙන්ම උතුරු, මධ්‍ය සහ දකුණු ඉන්දියාවේ හමුවී ඇති මේවා කුඹල් සක භාවිතයෙන් නිර්මාණය කොට තිබේ (වීලර් 1971: 16). මේවා ක්‍රිස්තු පූර්ව පස්වන සියවසින් මෑත කාලයෙහි එනම් ක්‍රිස්තු පූර්ව 350 - 250 ත් අතර කාලයේ ඉන්දියාවේ ගංගා නිම්න ප්‍රදේශ ආශ්‍රිතව පරිණාමය වී ව්‍යාප්තව ගිය සංස්කෘතියකට අයත් ය. උතුරු ඉන්දියාව සමඟ පැවති සම්බන්ධතා හරහා ශ්‍රී ලංකාවේ භාවිතයට පැමිණෙන්නට ඇති බවයි (Prickett 1990:81).

අළු පැහැති වර්ණාලේපිත බඳුන් (PGW) සකපුවරුවෙහි නිර්මාණය කර ඇති අතර ලෝකඩ යුගයට අයත් මැටි බඳුන් විශේෂයකි. මේවායෙහි සිහින් හරස්කඩක් දක්නට ලැබේ (වීලර් 1971:13). ඉන්දියාවේ අළු පැහැති මැටි බඳුන් ගංගා නිම්නය සහ ඉන්දු නිම්නය අතර තීරයෙහි බහුලව ව්‍යාප්තව ඇත. තවද බටහිරින් බිහාරය සහ දකුණින් උජ්ජෙයිනි (උදේනි) දක්වා ද පැතිරී ගොස් තිබේ. ඉන්දියාවේ විවිධ ස්ථානවලින් හමුවන මෙම බඳුන්වල ආරම්භය ක්‍රිස්තු පූර්ව අටවන සියවසට අයත් යැයි සැලකේ. එහෙත් හස්තිනාපුරයෙන් හමුවන මැටි බඳුන් සාධක මත මේවා ක්‍රිස්තු පූර්ව

**ISBN 978- 955-4563- 71- 1**

1100 ට හෝ ඊට පෙර කාලයකට හෝ අයත් යැයි සැලකීමට පාජිටර් වැනි විද්වතුන් උත්සාහ කරයි (වීලර් 1971:15).

ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද පැරණි ම මැටි බඳුන විශේෂය ලෙස අළු පැහැති මැටි බඳුන් (Plain Gray Ware) හැඳින්විය හැකිය. මේවා ක්‍රිස්තු පූර්ව 600 - 500 අතර මූල ඓතිහාසික අනුරාධපුර සමයට අයත්ය. උතුරු මධ්‍ය ඉන්දියාවේ වර්ණාලේපිත අළු පැහැති බඳුන් (PGW) සමඟ තැම්පත්ව තිබී මෙකී බඳුන් දොආබ් (DOAB) වැනි ස්ථානවලින් හමු වී තිබේ. මේවා උත්තර උද්දීප්ත කළු පැහැති බඳුන් (NBPW) සමඟ එකම ස්ථරවල තිබී ඉන්දියාවේ මෙන් ම ශ්‍රී ලංකාවෙත් හමු වෙයි (Prickett 1990:61). එයින් පැහැදිලි වන්නේ මූල ඓතිහාසික යුගයේ පටන් උතුරු ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර සම්බන්ධතා ගොඩනැගුණ බවයි.

එසේ ම අනුරාධපුර යුගය අයත් ක්‍රිස්තු පූර්ව 500 - 200 අතර පණ්ඩුකාභය රාජ්‍ය සමයේ සිදුකළ නගර නිර්මාණයේ දී මූලික සැලසුමේ යෝන හෙවත් බටහිර ආසියාතික වෙළෙන්දන් යැයි සැලකිය හැකි පිරිසකට වෙන් කළ කොටසක් පිළිබඳව සඳහන් වේ (සෙනෙවිරත්න 1995: 18). අනුරාධපුර ජේතවනාරාම කැණීම් බිමෙහි හමුවන මැටි බඳුන් මගින් මෙකී යුගයේ ඉන්දු නිම්නය සමඟ තිබූ සම්බන්ධතාවයන් පැහැදිලිවේ. ඉන්දියාවෙන් ආනයනය කරන ලැදැයි සිතිය හැකි සියුම් රතු පැහැති මැටි බඳුන් ( Fine Red Polished ware ) රතු පැහැති ගැටිය සහිත රෝසමය දුඹුරු පැහැ බඳුන් (Red Slipped Pinkish buff ware) මේ සඳහා නිදසුන් වේ (Ratanayake 1990: 45).

අනුරාධපුර ගෙඩිගෙයින් හමුවුණු කළු පැහැති හෙලනිස්ටික් බඳුන් (Black Hellenistic ware) ක්‍රිස්තු පූර්ව 200 -100 අතර කාලයෙහි මධ්‍යධරණී ප්‍රදේශවල භාවිත වී තිබේ. මේවා ඇනටෝලියාවේ සහ ලෙවන්ට් ප්‍රදේශවල ව්‍යාප්ත වී ඇති අතර වෙළඳාම හරහා මෙරටට පැමිණ තිබේ.

එසේ ම මධ්‍යධරණී ප්‍රදේශවල ක්‍රිස්තු වර්ෂ පළමුවන හා දෙවන සියවස්වල ප්‍රභවය වූ රතු පැහැති බඳුන් (Fine Red Ware) ද ශ්‍රී ලංකාවේ මාන්තායි, ජේතවනාරාමය, සීගිරිය යනාදී ස්ථානවලින් හමුවේ. මේවා දකුණු ඉන්දියාවේ ද බොහෝ ස්ථානවලින් හමු වී තිබේ (Prickett 1990: 162). පසුකාලීනව ඔප දමන ලද රතු පැහැති බඳුන් (Latter Red Polished ware) ක්‍රිස්තු වර්ෂ පස්වන සියවසට අයත් වන අතර ඒවා ශ්‍රී ලංකාවේ අනුරාධපුරය, අභයගිරිය, මිහින්තලය ආදී ස්ථානවලින් හමු වී ඇත. ඉන්දියාවේ බොහෝ ප්‍රදේශවලින් හමු වන මෙම බඳුන් ඉන්දියාවේ ප්‍රභවය වී තිබේ. ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර එම යුගයේ දී පැවති වාණිජ සම්බන්ධතා හරහා මෙරටට ලැබෙන්නට ඇත.

තවද කාන්තියෙන් දිලිසෙන මැටි බඳුන් ජේතවනාරාම ස්තූප මළුව අවටින් සොයාගෙන තිබේ. ක්‍රිස්තු වර්ෂ දෙවන හා තුන්වන සියවස්වලට අයත් මේවා සසේනියානු ආභාසය සහිතය. මින් පැහැදිලි වන්නේ ජේතවන දාගැබ ඉදිකිරීමට පෙර පටන්ම මෙරට සමඟ සම්බන්ධතා ගොඩනැගුන බවයි. ජේතවනයෙන් හමු වූ සමහර පිඟන් භාණ්ඩ බටහිර හා උතුරු ඉන්දියාවෙන් ආනයනය කළ ඒවාය (Rathnayake 1990:45). රතු ඔප දැමූ මැටි බඳුන් ඉන්දියාවෙන් ද රතු හා කළු ඔපදැමූ මැටි බඳුන් ප්‍රාග් ඓතිහාසික යුගය අවසානයේ සිට ආදිම ඓතිහාසික හා මධ්‍ය ඓතිහාසික යුග දක්වා කාලයේ දී ශ්‍රී ලංකාව උතුරු ඉන්දියාව සමඟ පැවැත් වූ සම්බන්ධතාවය හෙළි කරවයි (Prickett 1990:169). තිස්සමහාරාමයෙන් ද රතු ඔප දැමූ මැටි බඳුන් හමු වී ඇත. ඉන්දියාවේ රතු ඔප දැමූ මැටි බඳුන් ව්‍යාප්තවීමත් සමඟ වෙළෙඳාම හරහා මේවා ශ්‍රී ලංකාවට ලැබෙන්නට ඇත. මෙවැනි සාධක මගින් ද පැහැදිලි වන්නේ මුල් යුගයේ සිටම උතුරු ඉන්දියව සමඟ සම්බන්ධතා පැවැත් වූ බවයි. මෙකී සම්බන්ධතා ශ්‍රී ලංකාව සමඟ නිරන්තරයෙන් පවතින්නට ඇත. උතුරු ඉන්දියාවෙන් මෙරටට ජනතාව එන්නට හෝ මෙරටින් ඒ රටට ජනතාව යන්නට ඇත. කුමන හෝ මාර්ගයකින් උතුරු ඉන්දියාව සමඟ පැවැත් වූ සම්බන්ධතාවල එක් ප්‍රතිඵලයක් වූයේ උතුරු ඉන්දිය භාෂා ප්‍රාකෘතවල ලක්ෂණ සිංහල භාෂාව කෙරෙහි බලපැවැත්වීමයි.

එසේම ශ්‍රී ලංකාව බාහිර ලෝකය සමඟ සම්බන්ධතා ගොඩනගා ගත් බව තහවුරු කරන ප්‍රබල සාධකයක් ලෙස පුරාණ කාසි හැඳින්විය හැකිය. මාන්තායි, ගොඩවාය ආශ්‍රිත වලවේ ගං මෝය සිට රිදියගම ප්‍රදේශයේ කළ පුරාවිද්‍යාත්මක පර්යේෂණ, අනුරාධපුර සල්ගහවත්ත, ජේතවනාරාමය, අභයගිරිය, තිස්සමහාරාමය අකුරුගොඩ, සීගිරිය යනා දී ස්ථානවල සිදු කෙරුණු කැණීම්වලින් සහ නෙයෙකුත් ස්ථානවලින් හමු වූ දහස්ගණන් කාසි එකතුන් මගින් ඒ බව පෘථුල කරවයි.

ශ්‍රී ලංකාව පුරා සිදු කෙරුණු පර්යේෂණවලදී අනාවරණය කරගත් කාසි වර්ග කිහිපයකි. හස් එබූ කාසිය, ලක්ෂ්මී කාසිය, සිංහ කාසිය, බෞද්ධ ස්වස්තික කාසිය, රන් කහවනුව, තඹ මසු කාසි මෙන්ම විදේශීය පාණ්ඩ්‍ය, රෝම, චීන, පර්සියානු කාසි ඒ අතර කිහිපයකි.

ලක්දිව මෙන්ම ඉන්දියාවේ භාවිත මුල්ම කාසිය ලෙස හැඳින්වෙන්නේ හස් එබූ කාසිය යි. එකම කාලයක දෙරටෙහිම භාවිත වී ඇති මෙම කාසිය (Codrignton 1924: 16) ශ්‍රී ලංකාවේ නොයෙක් ප්‍රදේශවලින් හමු වී ඇත. අනුරාධපුරය, කන්තරෝදය, යාපනය, සීගිරිය, ත්‍රිකුණාමලය, වෙස්සගිරිය, තොලුවිල, මීරිගම, පදවිය, මිනුවන්ගොඩ, වල්ලිපුරම්, මාතොට, උඩවලව, දැදිගම, තිස්සමහාරාමය

**ISBN 978- 955-4563- 71- 1**

සහ අම්බලන්ගොඩ එකී ස්ථාන කිහිපයකි. කාසි ව්‍යාප්තිය දෙස බැලීමේදී ශ්‍රී ලංකාව පුරාම විසිරී ගොස් ඇති ආකාරයක් පෙනෙන්නට තිබේ. මෙකී කාසිය ක්‍රිස්තු පූර්ව දෙවන සියවස සිට ක්‍රිස්තු වර්ෂ දෙවන, තුනවන සියවස පමණ තෙක් භාවිත වී ඇති බවට සාධක හමුවෙයි.

හස් එබූ කාසිය ඉන්දියාවේ මුල්ම අවස්ථාවේ වයඹ දිග ප්‍රදේශවල භාවිතයේ තිබී පසුව මුළු ඉන්දියාව පුරාම පැතිර ගොස් තිබේ. තක්ෂිලා, ලෞරිය නන්දගර්, මථුරා, ශිශුපාලගර්, කොණ්ඩපූර් මෙන් ම කොයිම්බටෝර්හි පණ්ඩුකුලි, හයිදරාබාදවල විවිධ ස්ථාන, ආන්ධ්‍ර වැනි උතුරු, මධ්‍ය, හා දකුණු ඉන්දීය ප්‍රදේශවලින් හමු වී තිබේ (ප්‍රේමතිලක 2001:9). මින් ද පැහැදිලි වන්නේ ඉන්දියාව පුරාම ව්‍යාප්ත වූ බවකි.

ක්‍රිස්තු පූර්ව යුගයේ භාවිත වූ කාසියෙහි නිර්මාණය පිළිබඳව ප්‍රධාන මත දෙකක් පවතී. එනම් ඉන්දියාවේ නිපදවා මෙරටට ගෙන ආ බව සහ දේශීය වශයෙන් නිර්මාණය කළ බවයි. මෙම මතයන් දෙකම පිළිගත හැකි සාක්ෂි ද හමු වී ඇත. කොඩ්රින්ටන් මහතාගේ අදහස වන්නේ හස් එබූ කාසිය ඉන්දියාවේ නිපදවා ඇති බවයි. එම නිසා මෙම කාසිය ඉතාම සමීප වන්නේ දකුණු ඉන්දියාව සමඟ බවය (Codrington 1924: 16). නමුත් මුදල් භාවිතය පිණිස යොදාගනු ලැබූ ප්‍රධාන කාසි වර්ගයක් වූ හස් එබූ කාසිය උතුරු ඉන්දියාවේ ක්‍රිස්තු පූර්ව හතර වන සියවසේ තඹ ගුලි හා තඹ පිඩුවලින් නිර්මාණය කොට තිබේ (ජයසිංහ 1997:18). ගංගා නිම්න නාගරීකරණයේ ප්‍රතිඵලයක් වශයෙන් මේවා දකුණට විතැන්ව, ඉන්දීය අර්ධද්වීපය හා ශ්‍රී ලංකාව පුරාම පැතිරී ගියේය (සිරිසෝම හා අමරසිංහ 1986).

ඒ අනුව පුරාණ ඉන්දියාවේ කර්ෂාපණ නමින් හැඳින් වූ කාසි නාණක විද්‍යාඥයින් ප්‍රධාන වර්ග දෙකකට බෙදා දක්වයි. සීමිත ප්‍රදේශයක් තුළ පමණක් ව්‍යවහාර වූ කාසිය (ජනපද කාසි) සහ විශාල ප්‍රදේශයක් පුරාම ව්‍යවහාර වූ කාසි වර්ගය යනුවෙනි (බෝපේආරච්චි 1997:22). මෙම විශාල ප්‍රදේශයක් පුරා සංසරණය වූ අධිරාජ්‍ය කාසිය පූර්ව හා මුල් කාලීන මෞර්ය යුගයට අයත් සහ මධ්‍ය හා පශ්චාත් කාලීන මෞර්ය යුගයට අයත් යනුවෙන් ඒවායෙහි ස්වරූපයන් අනුව හඳුනාගෙන තිබේ. මුල් කාලීන මෞර්ය යුගයේ නිර්මාණය කළ කාසි විශාල වූ අතර ඝනකමින් අඩුය. පසුකාලීන මෞර්ය කාසිය ඉතා කුඩා වුවත් ඝනකමින් වැඩි ආකාරයට නිර්මාණය කර ඇත. ශ්‍රී ලංකාවෙන් හමු වී ඇත්තේ මධ්‍ය හා පශ්චාත් කාලීන මෞර්ය යුගයට අයත් කාසියි (බෝපේආරච්චි 1997:22). කොඩ්රින්ටන් මහතා අදහස් කරන පරිදි ශ්‍රී ලංකාවේ භාවිත වූ හස් එබූ කාසි ඉන්දියාවෙන් ආනයනය කරන්නට ඇතැයි යන අදහස පිළිගත හැක්කේ ශ්‍රී ලංකාවට පමණක් ආවේණික වූ කිසිදු සංකේතයක් සහිත හස් එබූ කාසියක් හමු නොවීමෙනි. මෙරටින් හමු වී ඇති සියලු කාසිවල දැක්වෙන සටහන් ඉන්දියාවේ හස් එබූ කාසිවල දැක්වෙන සටහන් සමඟ දක්වන්නේ පුදුමාකාර සමානකමකි. එනම් කාසිවල යෙදූ සංකේත, ලෝහ වර්ගය සහ බර සමාන වීම, සංකේත ස්ථානගත කර ඇති ආකාරයේ සමානතාව හා ප්‍රධාන සංකේතය ලෙස සූර්ය සංකේතය යොදාගැනීම මෙන්ම හැඩය සහ ඝනකම සමානවීම යනාදිය (ජයසිංහ 2006: 13) මීට නිදසුන් කිහිපයකි. නමුත් අනුරාධපුර ගෙඩිගේ හා තිස්සමහාරාමයේ අකුරුගොඩ සිදුකළ කැණීම්වලින් හමු වූ කාසි අච්චුවලින් පැහැදිලි වන්නේ එම කාසිවලින් සමහරක් මෙරට නිපදවා ඇති බව යැයි කොඩ්රින්ටන් මහතාගේ අදහස විය (Boopearachchi & Weerakkody 1998:153). මෙම මැටි අච්චු උතුරු ඉන්දියාවේ හර්යානාවලින් හමු වී ඇති මැටි අච්චුවලට බොහෝ සේ සමාන ය. කාසි නිකුත් නොකෙරුණු කාලයක ඉන්දියාවේ මෙන් ම ශ්‍රී ලංකාවේ ද කාසි නිෂ්පාදකයින් විසින් කාසි නිකුත් කර ඇති බව සිතිය හැකිය. ඒ මන්ද යත් හස් එබූ කාසි නිපදවීමේ මුල් අවස්ථාවේ යොදාගත් ශිල්ප ක්‍රමයට හාත්පසින්ම වෙනස් වාත්තු කිරීම මගින් කාසි නිර්මාණය කරගන්නා ක්‍රමයක් අනුගමනය කර ඇති බැවිනි (බෝපේආරච්චි 1997: 22).

පසුකාලීනව කාසි නිර්මාණයේ දියුණු, සංවර්ධනීය තත්ත්වයක් ළඟා කරගෙන තිබේ. කාසියට අවශ්‍ය සංකේත සියල්ලම එකම අච්චුවකට ගෙන උණුකළ ලෝහ වැක්කිරීමෙන් එකවර කාසි නිර්මාණය කරගත් කාසි අච්චු කිහිපයක් මෙරටින් හමුව ඇත. මෙවැනි අන්දමේ කාසි අච්චු කිහිපයක් මධ්‍ය, නැගෙනහිර ඉන්දියාවේ මථුරා, ශිශුපාලගර් හා කොණ්ඩපූර් වැනි ස්ථානවලින් හමු වී තිබේ. මේවා නීති විරෝධී ලෙස කාසි නිපදවීම සඳහා භාවිත කළ හොර කාසි අච්චු බව ඇතමුන්ගේ අදහස විය (සිරිසෝම හා අමරසිංහ 1986: 14).

ශ්‍රී ලංකාවේ මෙන්ම ඉන්දියාවේ හස් එබූ කාසිවල දක්නට ලැබෙන පොදු සංකේතය වූ සූර්ය සංකේතයට අමතරව ප්‍රධාන සංකේතයක් ලෙස වෘෂභ සංකේතය හැඳින්විය හැකිය. එහෙත් මෙකී සංකේතය එකම මුද්‍රාවක ඇතුළත් වූ එකම රූපාකාරයේ සංකේතයක් නොවීය. ඉන්දු නිම්නයේ මෙන්ම හින්දු සංස්කෘතියේ ද ගවයා ගෞරවයට පාත්‍ර වූ සතෙකි. වෘෂභ රුව ගවයාගේ මාතෘභූමිය ලෙස සැලකෙන ඉන්දියානුවන්ගේ ස්වදේශීය සංකේතයක් වශයෙන් සලකනු ලැබුව ද මෙරටෙහි දක්නට ලැබෙන වෘෂභයාගේ මොල්ලිය එතරම් මතුකොට නොදක්වා සාමාන්‍ය ගව රුවක් ලෙස දක්වා තිබේ (සිරිසෝම හා අමරසිංහ 1986: 30). මීට අමතරව මාළුවා, කඟවේණා, බල්ලා, ගෙම්බා, ඇතා ආදී සත්ත්ව සංකේත ද නන්දිපාදය, ස්වස්තික මෙන්ම මානව රූපද දෙරටෙහිම සමානතාවයකින් දක්වා තිබේ.

**ISBN 978- 955-4563- 71- 1**

කාසිවල සංකේත යෙදීමේ ශිල්ප ක්‍රමයෙහි ද සමානතාවයක් දෙරටෙහිම කාසිවල දක්නට ලැබේ. සිරස්, තිරස් හා ඇල ආකාරයට මේවායෙහි සංකේත ඔබ්බවා තිබේ. මීට අමතරව ඍජු කෝණාස්‍රාකාර, වෘත්තාකාර, ඕවලාකාර, සමචතුරස්‍රාකාර යන හැඩයන්ගෙන් හා විවිධ ප්‍රමාණවලින්, සමාන ඝනකමකින් කාසි නිර්මාණය කර ඇත. කාසි කොතරම් සමාන ද කිවහොත් ඉන්දියාවේ හා මෙරටින් හමු වූ කාසි එක් ගොඩකට දැමුව හොත් වෙන් වෙන් වශයෙන් හඳුනා ගැනීමට නොහැකි තරම්ය (සිරිසෝම හා අමරසිංහ 1986: 31). ඒ අනුව ක්‍රිස්තු පූර්ව තුන්වන සියවස පටන් උතුරු ඉන්දියාවේ බලපෑම් මෙරටට ලැබුණ බව පැහැදිලි වෙයි.

මෙරට සිදු වූ වෙළෙඳාමේදී හුවමාරු වූ කාසියක් ලෙස ස්වස්තික කාසිය හැඳින්විය හැකිය. මෙකී කාසිය ක්‍රිස්තු වර්ෂ පළමුවන සියවසේ සිට ක්‍රිස්තු වර්ෂ හතරවන සියවස දක්වා ලාංකිකයින් අතර සංසරණය විය. ක්‍රිස්තු වර්ෂ පළමුවන සියවස ආරම්භයත් සමඟ විටින් විට හස් සලකුණු යෙදීමෙන් පිළියෙල කරගත් කාසි වෙනුවට සලකුණු කිහිපයක් එකම අච්චුවකට ගෙන පිළියෙල කරගත් වටකුරු කාසියක් ලෙස සැලකිය හැකි බෞද්ධ ස්වස්තික කාසිය ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවලින් හමුවී තිබේ. අනුරාධපුර අභයගිරිය, ජේතවනාරාමය, ථූපාරාමය, කිරිබත් වෙහෙර, මිහින්තලය, තිස්සමහාරාමය, නාගදීපය, දිගාමඩුල්ල ඉන් කිහිපයකි.

ස්වස්තික කාසියේ ඊට අනුකූලව නිපද වූ භාගය, කාල, 1/4, 1/8 ආදී කුඩා කාසිය දක්වා වූ අනු කාසි දැකිය හැකිය. මේවායෙහි දැක්වෙන සංකේත බොහෝමයක් ඉන්දියාවේ කාසිවලද දක්නට ලැබේ. ස්වස්තික කාසිය යන ව්‍යවහාරයෙන් කාසිය නම් කිරීමට හේතු වූ ස්වස්තිකය ඉන්දියාවේ ගෝත්‍ර කාසි වූ ඖදුම්බර, උජ්ජෙයිනි, ඒරාන්, කෞශාම්බි, තක්ෂිලා ආදී කාසිවවලද දක්නට ලැබෙයි. මෙම කාසි ක්‍රිස්තු වර්ෂ දෙවන සියවසට අයත් කුනින්දාස්හි භාවිත වූ කාසි සමඟ ද යම්කිසි සමානත්වයක් දක්වයි (Codrington 1924: 20). කොඩ්රින්ටන් මහතාගේ අදහසට අනුව ස්වස්තික කාසිය සඳහා බෞද්ධාගමික ආභාසය මෙන්ම භාරතීය ආභාසය ද ලැබී තිබෙයි. තව ද ස්වස්තික කාසියෙහි දක්නට ලැබෙන බොහෝමයක් සංකේත හස් එබූ කාසිවල ද දක්නට ලැබේ. නිදසුනක් ලෙස ඇතා, චතුරස්‍රයක් හතරට බෙදූ ඊමත අතු බෙදුන වෘක්ෂය දැක්විය හැකිය. මෙම වේදිකාවක් මත වෘක්ෂයක් දැක්වෙන සංකේතය පහළ මහානදී නිම්නයේ හා ඩෙකෑන් මුහුදු බඩ බිම් තීරයේ පැතිරි ගිය කාලිංග රාජධානියට අයත් ජනපද කාසිවල ආරම්භයේ සිටම දක්නට ලැබෙන අතර (බෝපේආරච්චි 1997:22). මෞර්ය හස් එබූ කාසිවල ද බහුලව දැකිය හැකි සංකේතයක් විය. හරප්පා සංස්කෘතියේ වූ මුද්‍රා අතර ද මෙම සංකේතය දක්නට ලැබේ.

කුහර සහිත චෛත්‍ය දැක්වෙන සංකේතය මෞර්ය අධිරාජ්‍ය සමයේ නිකුත් කළ හස් එබූ කාසිවල යෙදුන පොදු සංකේත අතරින් එකකි. උජ්ජෙයිනි, සාතවාහන, යෞධෙය හා මහා ක්ෂත්‍රප ආදී ඉන්දියාවේ මුල් කාලීන කාසිවල දැක්වෙන සංකේත අතරින් එකකි ස්වස්තිකය. ඒ අනුව මුල් කාලීන ඉන්දියානු තඹ කාසිවලින් ඍජුවම හෝ ඒවා අනුකරණය කරමින් බෞද්ධ ස්වස්තික කාසිය නිකුත් කරන්නට ඇත. මේ අනුව පැහැදිලි වන්නේ ස්වස්තික කාසිය සඳහා වයඹදිග හා මධ්‍ය නැගෙනහිර ඉන්දීය ආභාසය ලැබුණ බවයි.

ක්‍රිස්තු වර්ෂ තුන්වන සියවස පමණ මෙරට සංසරණය වූ ලක්ෂ්මී කාසියේ අභිමුඛයෙහි නිරූපණය වන්නේ ලක්ෂ්මී දේවිය යැයි විශ්වාස කරයි. ලක්ෂ්මී දෙවඟන ඉන්දීය සමාජයේ වන්දනාවට පාත්‍ර වූ දෙවඟනකි. ඉන්දියාවේ වන්දනාවට පාත්‍ර වූ මෙම සංකල්පය මෙරටට ද ලැබෙන්නට ඇත. මේ නිසා මෙරට ජනතාව අතර ලක්ෂ්මී සංකල්පය තදින් ම මුල් බැසගෙන තිබුණා විය හැකිය. එම නිසා එකල නිර්මාණය වූ දේශීය කාසියට ලක්ෂ්මී රුව ඇතුළත් කරන්නට ඇත. අනුරාධපුර සල්ගහවත්ත කැණීමෙන් ලක්ෂ්මී කාසි 42 ක් හමු වීම ඇතුළුව ශ්‍රී ලංකාව පුරාම ලක්ෂ්මී කාසි හමුවීමෙන් පැහැදිලි වන්නේ භාරතීය ආභාසයන් නොඅඩුව මෙරටට බලපෑ බවයි.

ක්‍රිස්තු පූර්ව 186/187 වන සියවස්වල මෞර්ය අධිරාජ්‍යයේ බලය බිඳ වැටීම හේතුකොට ගෙන ඉන්දියාවේ බලය විදේශීය ජාතීන් කිහිපයකට හිමිවියි. එනම් ඉන්දු ග්‍රීක, ශක, පාර්තියන්, කුෂාණ යන පෙළපත් බලයට පත්විය. වයඹ දිග ඉන්දියාව පාලනය කළ විදේශීය ජාතියක් වූ ඉන්දු ග්‍රීකවරුන් බැක්ට්‍රියාවේ සිට වයඹ දිග ඉන්දියාවට පැමිණ බලය තහවුරු කර ගත්තේ ය (ප්‍රේමතිලක 2001:13). විවිධ දේශපාලන හා සංස්කෘතික බහුවිධතාවයන්ගෙන් සමන්විත මෙම රජ පෙළපත් නිකුත් කළ කාසි යම් ප්‍රමාණයක් මෙරටින් හමු වී තිබේ. මිනැන්ඩර්, සෝටර්මෙගාස් ආදී රජවරුන්ගේ කාසි ඒ අතර විය.

අකුරුගොඩ, ජේතවනාරාමය, දකුණු වෙරළ ආශ්‍රිත ස්ථාන කිහිපයක කුෂාණ රජ පෙළපතට අයත් කාසි හමු වී තිබේ. ක්‍රිස්තු වර්ෂ 200 - 212 ත් අතර පාලන බලය මෙහෙය වූ දෙවන කණිෂ්ක රජුගේ කාසි, වාසු දේව වැනි රජවරුන්ගේ කාසි ඒ අතර විය (බෝපේආරච්චි 1997:24). මෙලෙස කාසි හමුවීම හා මූල බ්‍රාහ්මී ශිලාලේඛන කිහිපයක කාබොකඩ, කබොක්ඩිය හා කබොක්ඩික යන නම්වලින් හැඳින් වූ වෙළෙඳ ශ්‍රේණි හා සාමාජිකයින් පිළිබඳව සඳහන්වීමෙන් (Paranavitana 1970: no.622,990). පැහැදිලි වන්නේ නිරිතදිග ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර සමීප සම්බන්ධතාවක් පැවති බවයි. කාබොජයන් මෞර්ය අධිරාජ්‍යයේ බටහිර පිහිටි ඇරකෝසියාව නිජ භූමි කරගත්, ඉරාණීය ප්‍රභවයක් සහිත භාෂාවක් කථා කරන ජන කොට්ඨාසයකි (බෝපේආරච්චි 1997:24).

**ISBN 978- 955-4563- 71- 1**

ක්‍රිස්තු පූර්ව පළමුවන සියවසේ පමණ නැගෙනහිර අයිරානයෙන් පැමිණි ඉන්දු නිම්නයේ පහළ ප්‍රදේශයේ බලය පැතිර වූ ශක පාලකයින්ගෙන් පැවත එන ක්ෂත්‍රපයින් ගුප්ත අධිරාජ්‍ය හා සමකාලීනව බටහිර ඉන්දියාවේ සැහෙන ප්‍රදේශයක් පාලනය කළේය (ප්‍රේමතිලක 2001:27). මොවුන් සතුව විශාල බලයක් පැවති අතර මෙරට සමඟ ද සම්බන්ධතා පවත්වා තිබේ. ඒ බව කාසිවලින් මෙන් ම බ්‍රාහ්මී අක්ෂර මාලාව මගින් ද පැහැදිලි වෙයි. බ්‍රාහ්මී අක්ෂර මාලාව විකාශනයවීමේ දී සිදු වූ අක්ෂරවල ශීර්ෂය නැතහොත් අක්ෂරයේ මුදුනතින් හිසක් ඇති වීම ක්‍රිස්තු වර්ෂ පළමුවන සහ ක්‍රිස්තු වර්ෂ හතරවන සියවස අතර මෙරට අභිලේඛනවල දක්නට ලැබෙයි. කාසි අතර ක්‍රිස්තු වර්ෂ 234 - 239 අතර රජ පැමිණි වීරදාමන්ගේ රිදී කාසියක් දෙවන කණිෂ්ක රජුගේ කාසියක් සමඟ හමුවීමෙන් (බෝපේආරච්චි 1997:24). පැහැදිලිවන්නේ මෙරට සමඟ බටහිර ක්ෂත්‍රපයින් යම්කිසි ආකාරයක සම්බන්ධතාවයක් පැවැත් වූ බවයි. මීට අමතරව ගෞතමී පුත්‍ර සාතකර්ණි වැනි සාතවාහන පාලකයින්ගේ කාසි සහ ගුප්ත රජ පෙළපතේ සමුද්‍ර ගුප්ත, චන්ද්‍ර ගුප්ත, ස්කන්ධ ගුප්ත ආදී පාලකයින්ගේ කාසි ද මෙරටින් සොයාගෙන තිබේ. මේවා පැරණි ඉන්දියානු කාසිවල අවසාන නිකුත් කිරීම් ලෙස සැලකිය හැකි ය (බෝපේආරච්චි 1997:24).

මෙවැනි නාණක විද්‍යාත්මක සාධක මගින් මුල් යුගයේ උත්තර භාරතීය බලපෑම මෙරටට ලැබුණ බව පෙනේ. ඒ අනුව සිංහල භාෂාවේ පරිණාමය සඳහා එකී බලපෑම හේතුවන්නට ඇති බව පැහැදිලි වේ.

යම් කිසි රටක් ජාතියක් හෝ සංස්කෘතියක් සතුව පවත්නා වූ ආගමික දේශපාලන, සමාජීය, ආර්ථික, සංස්කෘතික ව්‍යුහය නිරූපණය කරන ප්‍රබල මාධ්‍යයක් ලෙස ප්‍රතිමා හා මූර්ති කලාව හැඳින්විය හැකි ය. ඊට හේතුවන්නේ එකී සංස්ථාවල සිදුවන වෙනස්කම් සමඟම කලාකෘතිවල ආකෘතික හැඩයන් හෝ රටාවන් වෙනස්වීමට භාජනය වන ආකල්ප හා දෘෂ්ටීන් ද වෙනස්වීමයි. ඒ අනුව රටකට බලපෑ විවිධ ආභාසයන් හඳුනාගැනීමට ප්‍රතිමා හා මූර්ති කලාව මගින් හැකියාව ලැබෙයි.

මුල් යුගයේ පටන් ම නොයෙක් ජාතීන් මෙරට ට පැමිණි අතර ඔවුන්ගේ ආභාසයන් මෙරටට ලැබී තිබේ. ඒවා භාෂාවක සිදුවන වෙනස්වීම් මත හඳුනා ගැනීමට හැකි වුවත් එකී කරුණු තහවුරු කිරීම සඳහා ප්‍රතිමා කලාව වැදගත් වේ. මෙරට දක්නට ලැබෙන ප්‍රතිමා, මූර්ති, චිත්‍ර කලාවන් සඳහා ඉන්දියාවේ පැන නැගුණ විවිධ කලා සම්ප්‍රදායන් ගේ එනම් මෞර්ය, සුංග, මථුරා, ගාන්ධාර වැනි උත්තර දේශීය සම්ප්‍රදායන් මෙන්ම අමරාවතී, ආන්ද්‍ර හෙවත් සාතවාහන, පල්ලව, පාණ්ඩ්‍ය වැනි දක්ෂිණ ඉන්දීය කලා සම්ප්‍රදායන්ගේ බලපෑම් ද ලැබුණ බවට සාධක හමුවෙයි. කුමන ආකාරයේ බලපෑමක් ලැබුණ ද මෙරට කලා ශිල්පීන් තමන්ට අනන්‍ය වූ දේශීය ලක්ෂණ සහිතව තම කලා නිර්මාණ බිහි කළ බව පෙනේ (බස්නායක 2002: 127 ; විජේසේකර 1962: 238).

ශ්‍රී ලංකාව හා ඊට ආසන්නව පිහිටි රටවල් විශේෂයෙන් ම ඉන්දියාව සමඟ සම්බන්ධතා ගොඩනගා ගත්තේය. මේවා හුදෙක් වාණිජමය පරමාර්ථය ප්‍රමුඛ කොට සිදුවුවත් දේශපාලන, ආගමික හා සංචාරය යන අරමුණු ද මීට බලපෑ කරුණු ලෙස දැක්විය හැකිය. ශ්‍රී ලාංකිකයින් මෙරටින් වෙනත් රටවලට ආගමනය වූවාට වඩා වෙනත් රටවලින් මෙරටට ආගමනය වූ පිරිස් වැඩිවිය. කෙසේ හෝ මෙම සම්බන්ධතා ඔස්සේ දැනුවත් ව හෝ නොදැනුවත්ව මෙරටට ආගමික වූ ද ලෞකික වූ ද කලා විෂයක් ලැබුණි (විජේසේකර 1962: 233).

මෙරට දක්නට ලැබෙන මූර්ති කලාවේ මුල්ම ලක්ෂණ දක්නට ලැබෙන්නේ උතුරු ඉන්දියානු සම්ප්‍රදායෙන් ය. ඉන්දියාවේ ජනිත වූ මෙම සම්ප්‍රදායයන්ට අපරදිග, වයඹ හා අග්නිදිග සංස්කෘතීන්ගේ මිශ්‍රවීමක් ඇති බව නොරහසකි. මන්ද යත් බටහිර හා වයඹදිග දේශසීමාවලින් ඉන්දියාවට පැමිණි ආර්ය ආක්‍රමණිකයින් ඉන්දීය ස්වදේශීය සංස්කෘතිය වෙනස් කිරීමට තරම් ප්‍රබලවීමෙන් ඒ බව පැහැදිලිවේ. ක්‍රිස්තු පූර්ව 1500 ට පසු ඉන්දියාවේ විද්‍යමාන වූ විවිධ සංස්කෘතීන් නොයෙක් හේතූන් මත සම්මිශ්‍රණයවීමේ ප්‍රතිඵලයක් ලෙසද මෙය හැඳින්වීම නිරවද්‍ය ය (විජේසේකර 1962:145).

ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන මූර්ති අතර ප්‍රධාන ස්ථානයක් බුද්ධ ප්‍රතිමාවට හිමි වේ. විවිධ රටවල හා විවිධ කාල පරාසයන් තුළ ජීවත් වූ බෞද්ධ කලා ශිල්පීන් බුද්ධ රූපය දෙස වෙනස් වූ දෘෂ්ටින්ගෙන් බලා තිබේ. මුල් කාලීනව බුද්ධ ප්‍රතිමාව නිර්මාණය කිරීමට බියක් මෙන්ම අකමැත්තක් දැක්වීය. ඊට හේතු වූයේ එකී ශ්‍රේෂ්ඨ පුද්ගල රුවට හානියක් වේදැයි සිතූ නිසාවෙනි. එම නිසා බුද්ධ රූපය නිර්මාණය කිරීම වෙනුවට ධර්ම චක්‍රය, බෝධි වෘක්ෂය, වජ්‍රාසනය හෝ සිරිපතුල වැනි සංකේත නිර්මාණය කළේය. ඒ අනුව මුල්ම බුද්ධරූපය නිර්මාණය කළේ ග්‍රීක ආභාසය ලැබූ ගාන්ධාර කලා සම්ප්‍රදායට අයත් ශිල්පීන් බව පැවති මතය අද්‍යතනය වන විට බොහෝ උගතුන් විසින් බැහැර කර තිබේ. ඒ අනුව වයඹ දිග ඉන්දියාවේ ගාන්ධාර කලා සම්ප්‍රදාය ඇති වන්නට පෙර මථුරා හා ගාන්ධාරයේ පැවති දේශීය කලා සම්ප්‍රදායයන්ට අයත් ශිල්පීන් අතින් ක්‍රිස්තු පූර්ව පළමු වන සියවසේ දී බුද්ධ ප්‍රතිමාව නිර්මාණය කළ බව පිළිගෙන තිබේ. ඒ බව මෙතෙක් ඉන්දියාවෙන් සොයාගෙන ඇති පුරාවිද්‍යාත්මක සාධක අනුව ද නිගමනය කර ඇත (වික්‍රමගමගේ 2006:22).

මෙරට දක්නට ලැබෙන හිඳි පිළිම, හිටි පිළිම සහ සැතපෙන පිළිම සඳහා ඉන්දියානු සම්ප්‍රදායන් බලපා තිබේ. මෙම කලාවන් සඳහා වූ ශිල්පීය ආභාසය ඉන්දියාවෙන් ගත් බව සත්‍යයකි. මෙකී කාල

**ISBN 978- 955-4563- 71- 1**

පරාසයේ දී කැටයම් කිරීම, නිර්මාණය කිරීම හා සිතියම් කිරීමේ ශක්තියක් තිබූ බව පිළිගත යුතුය. එකී කාර්යයන් සඳහා සාංචි, භාරුත්, බුද්ධගයා සහ පැට්නා යන ස්ථානවලින් මූර්ති ශිල්පීන් ගෙන්වා ගන්නට ඇත (විජේසේකර 1962:159).

එසේම මෙරටින් හමුවී ඇති පැරණිතම බුද්ධ ප්‍රතිමාව (1962) අභයගිරි විහාරයෙහි ආසනඝරය කැණීමේදී සොයාගන්න ලදී. එම ප්‍රතිමාව වැලි ගලින් නිර්මාණය කොට වර්ණ ගන්වා තිබේ. හිඳි බුද්ධ ප්‍රතිමාවක් වූ මෙය අද්‍යතනයෙහි අනුරාධපුර පුරාවිද්‍යා කෞතුකාගාරයෙහි තැන්පත් කොට ඇත. දකුණු අතෙහි දකුණු උරයේ කොටසක් කැඩී ගොස් ඇති අතර හිස ගෝලාකාරය. දක්ෂිණාවර්ත කෙස් පිඩු හිසටම ඇලී තිබේ. හිස මුදුනෙහි අල්ප උන්නත රංසිපුෂ්ජය යි. වම් අතර උකුල මත සමාධි මුද්‍රාවෙන් දක්වා තිබේ. දකුණු අත අභය මුද්‍රාවෙන් හෝ සමාධි මුද්‍රාවෙන් තිබෙන්නට ඇතැයි සිතිය හැකිය. වීරාසන ක්‍රමයට පාද තබාගෙන සිටින අතර සිවුර ඒකාංශපාරුපනයෙන් යුක්තය.

මෙම ප්‍රතිමාවේ මුහුණ හා ශරීරය මෞර්ය යුගයට පෙර සිට ඉන්දියාවේ දේශීය කලාවේ යක්ෂ රූපවලට සමානය. පාද තබාගෙන සිටින වීරාසන ක්‍රමය ශ්‍රී ලංකාවේ සියලුම දේශීය හිඳි බුද්ධ ප්‍රතිමාවල දක්නට ලැබෙන පොදු ලක්ෂණයකි. මෙකී ලක්ෂණය ඉන්දියාව හා නැගෙනහිර ඉන්දියාවේ බෞද්ධ කලාවේද දක්නට ලැබෙන ලක්ෂණයකි. මේ අනුව බුද්ධ ප්‍රතිමාවේ ශෛලීය අනුව ඉන්දියානු දේශීය ලක්ෂණය වූ යක්ෂ රූප හා සමාන වන හෙයින් ශ්‍රී ලංකාවෙන් හමුවී ඇති මෙම බුද්ධ ප්‍රතිමාව ඉන්දියානු කලා සම්ප්‍රදායට අයත්වේ (වික්‍රමගමගේ 2006 :23).

ඒ අනුව මෙම බුද්ධ ප්‍රතිමාව අශෝක රාජ්‍ය සමයෙහි ශ්‍රී ලංකාවට පැමිණි ඉන්දීය කලා ශිල්පීන් අතින් මෙරටට අනන්‍ය වූ ආකාරයට නිර්මාණය කරන ලද්දක් හෝ ඉන්දීය ශිල්පින්ගෙන් පුහුණුව ලැබූ දේශීය කලාකරුවා අතින් නිම වූවක් වන්නට ද පුළුවන. ඉන්දියාවේ මුල් කාලයට අයත් යක්ෂ රූපවල ශෛලීය හා ප්‍රාථමික ලක්ෂණවලින් සමලංකෘත වන හෙයින් මෙකී බුද්ධ ප්‍රතිමාව ක්‍රිස්තු පූර්ව තුන්වන සියවසට හෝ ඊට පසු කාලයට අයත් යැයි නිගමනය කළ හැකි ය (වික්‍රමගමගේ 2006 :23).

මුල් කාලීන චෛත්‍යවල වාහල්කඩ දැකිය හැකි මූර්තිවලින් මෙන්ම කැටයම්වල ද උත්තර භාරතීය ආභාසයන් පිළිඹිබු කෙරේ. එනම් මිහින්තලේ කණ්ඨක චෛත්‍ය නැගෙනහිර හා බටහිර වාහල්කඩ, අභයගිරියේ දකුණු වාහල්කඩ කැටයම් සහ ජේතවනාරාමය කැටයම් මේ අතර වැදගත්කමක් ගනියි. මෙම මූර්ති සඳහා යොදාගෙන ඇත්තේ හුණු ගල්ය. ඒවා හොඳින් ආරක්ෂා වී නොමැති හෙයින් මූර්තිවල සියලු අංග පැහැදිලිව හඳුනාගත නො හැකිය. නමුත් මේවායේ දක්නට ලැබෙන්නේ ඉතා පැරණි මධ්‍ය ඉන්දියාවේ සාංචි හා භාරුත් ස්තූපවල දක්නට ලැබෙන කැටයම් ය. මෞර්ය යුගයේ බිහි වූ සාංචි හා භාරුත් ස්තූප සුංගයින්ගේ පිබිදීමත් සමඟම සංවර්ධනය විය. නමුත් මුල් කාලීන මෞර්ය ලක්ෂණ ඒවායෙහි දක්නට ලැබේ.

කණ්ඨක චෛත්‍යයෙහි දක්නට ලැබෙන වාහල්කඩ දෙපස සමහර සතුන්ගේ හා පක්ෂීන්ගේ  රූප, මල් හා මිශ්‍රව කැටයම් කර ඇත. මේවා සාංචි හා භාරුත් පැරණි සම්ප්‍රදායට සමාන ය. මෙහි ඇති ප්‍රතිමා සාංචියේ මෙන් ඇත්, සිංහ, අශ්ව හා ගව යන සතුන්ගේ රූපවලින් වට වී තිබේ. ඒ අනුව සාංචියේ දක්නට ලැබෙන සම්ප්‍රදායේ ලක්ෂණ කිහිපයක් කණ්ඨක චෛත්‍යයෙහි ද ආරක්ෂා වී ඇති බව පෙනේ. ගණ සංකේත හා සැරසිලි මෝස්තර ඍජුවම ඉන් උපුටා ගත් බව පෙනේ. මිහිඳු මහ රහතන් වහන්සේ උපන් භූමිය ලෙස සැලකෙන්නේ වේදිසගිරියයි. එහි සාංචි ස්තූපය අශෝක අධිරාජ්‍යයා විසින් ගොඩනැගූ බව කියවෙයි. මෙකී ලක්ෂණ කණ්ඨක චෛත්‍යයෙහි ද දක්නට ලැබෙන හෙයින් භාරුත් හා සාංචි ප්‍රතිමා කලාව ප්‍රගුණ කළ කලා ශිල්පීන් මහින්දාගමනයත් සමඟ මෙරටට පැමිණෙන්නට ඇත. ඒ අනුව එම ශිල්පීන් මෙකී ස්තූප ගොඩනගන්නට ඇත. නැතහොත් ශ්‍රී ලාංකීක ශිල්පියා ඉන්දීය ආභාසය ලබාගෙන දේශයට අනන්‍ය වූ ආකාරයට මූර්ති හා කැටයම් නෙළන්නට ඇත. ඒ අනුව නිගමනය කළ හැකි වන්නේ මුල් කාලීන ප්‍රතිමා හා මූර්ති කලාව සඳහා උතුරු ඉන්දියාවේ බලපෑම තදින් ම ලැබුණ බවයි.

මිරිසවැටිය චෛත්‍ය වාහල්කඩ දක්නට ලැබෙන අශ්ව, ගව, සිංහ, ඇතුන් යන සත්ත්ව රූප හා අභයගිරියෙහි වූ මූර්ති අතර දක්නට ලැබෙන මානව රූප සාංචියෙහි දක්නට ලැබෙන මූර්තිවලට සමානය (Coomaraswamy 1927:161). එමෙන් ම රුවන්වැලි සෑ මළුව හා ජේතවනාරාම දාගැබ්වල ඇති ගණ රූප සාංචියේ බටහිර දොරටුවේ කණුවල රූප හා සමාන අතර පහතට තට්ටු වශයෙන් පිටතට නෙරා ඇති දාගැබ් මැදුර ද සාංචියට සමාන ය. එහි අතුළත කුළුණුවල දක්නට ලැබෙන රටා මෝස්තර සාංචියේ බටහිර දොරටුවේ කුළුණු හා සමානවේ.

මින් පැහැදිලි වන්නේ ක්‍රිස්තු වර්ෂ පළමුවන සියවස වන තෙක් ගංගා නදී මිටියාවතෙන් කලාත්මක සම්ප්‍රදායන් ලැබුණු බවයි. ඒ අනුව මෞර්ය හා සුංග සම්ප්‍රදායෙන් අධ්‍යාත්මික හා සම්ප්‍රදායික බෞද්ධ කලාවක මූලික ලක්ෂණ සැපයුණු  බව පෙනේ.

රුවන්වැලි සෑ මළුවෙහි දකුණු දොරටුව අසල ඇති භාතිය රජුගේ යැයි සැලකෙන ප්‍රතිමාව එඩිතරභාවයකින් නිරූපනය කොට තිබේ. එහෙයින් ඉන්දියාවේ පාඨලී පුත්‍ර, පාර්කවම් යන ස්ථානවලින් හමු වූ යක්ෂ රූප හා සමානතාවයක් දක්වයි.

**ISBN 978- 955-4563- 71- 1**

ක්‍රිස්තු වර්ෂ තුන්වන සියවස පමණ ඉන්දියාවේ ප්‍රබල රාජවංශයක් වූ ගුප්තවරු බලයට පත්විය. මෙම ගුප්ත සම්ප්‍රදාය මූර්ති කලාව කෙරෙහි පමණක් නොව සියලු සංස්කෘතික කටයුතු සඳහා සෘජුවම බලපෑවේය (විජේසේකර 1962:242).
ගුප්ත සම්ප්‍රදාය මත මෙරටට ලැබුණේ මහායාන පිළිම, බිතුසිතුවම් හා විවිධ ශෛලීමය මූර්තිය. ක්‍රිස්තු වර්ෂ පස්වන හා හයවන සියවස්වල මෙම සම්ප්‍රදායේ විශාල ප්‍රගතියක් දක්නට ලැබුණි. මෙකී සම්ප්‍රදාය මීට පෙර පැවති කලා සම්ප්‍රදායන්ට වඩා මෙරටට වැඩි බලපෑමක් සිදු කළේය. එනම් අනුරාධපුර බුද්ධ ප්‍රතිමා, සීගිරි බිතුසිතුවම් හා ඉසුරුමුණි කැටයම්වලින් ඒ බව පැහැදිලි වෙයි.
ගුප්ත සම්ප්‍රදාය නිසා ගල් ගරාදි පටිය හා බාල්ක කැටයම් කිරීම දක්නට ලැබෙයි. එමෙන්ම ගරාදි වැටවල චාම් කැටයම් දක්නට හැකිය. රූප වඩාත් අලංකාර ය. මේවායෙහි වඩාත් වැඩියෙන් විස්තර සටහන් වී ඇති අතර මෙම ශෛලියේ දී ගඩොල්, හුණුගල් හා කළුගල් භාවිත කර ඇත. ගල් භාවිත කළ අවස්ථාවක් ලෙස ක්‍රිස්තු වර්ෂ හතරවන සියවසට අයත් ඉසුරුමුණි පෙම් යුවළ දැක්වෙන කැටයම දැක්විය හැකිය. මෙහි මුල් කාලීන ගුප්ත ශෛලියෙහි ලක්ෂණ දක්නට ලැබෙයි (විජේසේකර 1962:244).

## නිගමනය

ඉහත කරුණු සැලකිල්ලට ගෙන නිගමනය කළ හැක්කේ පෙචර් මහතා පෙන්වා දෙන අන්දමට මහද්වීපයකට ආසන්නව පිහිටි රටක ඇති වන විශේෂිත වූ ලක්ෂණ ඊට තදාසන්නම රටට නිතැතින් ම බලපාන බව සහ වෙන්ව පිහිටීම නිසා එකී රටේ ශිෂ්ටාචාරයට පමණක් විශේෂ වන ලක්ෂණ දක්නට ලැබෙන බව යන්න සනාථ වන බවයි. බ්‍රාහ්මී අක්ෂරවලින් ලියා ඇති භාෂාව ශබ්ද තත්ත්ව හා රූප තත්ත්ව අනුව සාකල්‍යයෙන් ම තත් කාලීන ඉන්දීය ප්‍රාකෘත භාෂාවලට සමානය. ඉන්දියාවෙන් වරින් වර පැමිණ මෙහි පදිංචි වූ ජනතාව ව්‍යවහාර කළ දේශීය උපභාෂාවල බලපෑම නිසාත්, ඉන්දියාවෙන් වෙන්ව පිහිටීම නිසාත්, ඉන්දීය ප්‍රාකෘත භාෂාවල දක්නට නොමැති මිශ්‍ර ලක්ෂණ රැසක් සිංහල භාෂාවේ දක්නට ලැබේ. මෙම කරුණ තවදුරටත් පැහැදිලි කරන්නේ නම් අධ්‍යයන කාලයට අදාළව නාම පද හා ක්‍රියා පද පරීක්ෂා කිරීමේ දී පැහැදිලි වන්නේ සිංහල භාෂාව සකස්වීම සඳහා තත්සම වචනවලට වඩා තත්භව වචනවලින් සිදු වූ බවයි (වගු අංක 01). මින් එළඹිය හැකි නිගමනය වන්නේ ශ්‍රී ලාංකිකයින් ඔවුන්ට ම අනන්‍ය වූ ආකාරයට භාෂාව ව්‍යවහාර කළ බවයි.

## ආශ්‍රිත ග්‍රන්ථ


අමරවංශ හිමි, කේ. 1969 ***ලක්දිව සෙල්ලිපි.*** කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.
ආටිගල, එන්. 2000 ***ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය.*** පළමුවන කාණ්ඩය. කැලණිය: කැලණිය විශ්වවිද්‍යාලය.
ආර්යසිංහ, ඒ. සහ ආර්. එම්. ඩබ්ලිව්. රාජපක්ෂ 1989 ***භාෂා විඥාන භාෂා විෂයක ලිපි සංග්‍රහය.*** රදාවාන: අබයරත්න මුද්‍රණාලය.
ඉන්ද්‍රපාල, කේ. 2000 ශ්‍රී ලංකාවේ මුල් දෙමළ ජනාවාස, ***උරුමයක ආවර්ජන.*** පළමු වන කලාපය, (සං.) ආර්.ඒ.එල්.එච්. ගුණවර්ධන, එස්. පත්මනාදන්, එම් රෝහණදීර, කොළඹ: මධ්‍යම සංස්කෘතික අරමුදල, පිටු. 17-37.
උඩගම, පී. 1965 භූගෝලීය පසුතලය ඉතිහාසය කෙරෙහි බල පෑ අයුරු, ***අනුරාධපුර යුගය.*** (සං.) අමරදාස ලියනගමගේ, රණවීර ගුණවර්ධන, කැලණිය: විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය, පිටු. 37-45.
එල්ලාවල, එච්. 1964 ***පුරාතන ලංකාවේ සමාජ ඉතිහාසය.*** බත්තරමුල්ල: සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.
කල්දේරා, එල්. 1959 ***ලකාවේ මිල මුදල්.*** කොළඹ: ජාතික කෞතුකාගාරය.
කල්‍යාණවංශ හිමි, 1964 ***ලංකාවේ ඓතිහාසික භූමි සිතුවම්.*** කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.
කිරිබමුණ, එස්. 2000 ඉන්දියානු සාගරයේ වෙළඳ ජලය තුළ මහාතිත්ථ තොටුපොල නගරයේ භූමිකාව, ***උරුමයක ආවර්ජන.*** (සං.) ආර්.ඒ.එල්.එච්.ගුණවර්ධන, එස්. පත්මනාදන්, එම් රෝහණදීර, කොළඹ: මධ්‍යම සංස්කෘතික අරමුදල, පිටු. 499-522.
කුමාරතුංග, ඩී. ජී. 1997 ශ්‍රී ලංකාවට ආර්යයන්ගේ පැමිණීම හා ජනාවාස ව්‍යාප්තිය, ***ශ්‍රී ලංකාවේ ඉතිහාසය*** (ආරම්භයේ සිට කෝට්ටේ යුගය අවසානය දක්වා). කඩවත: අභය මුද්‍රණය, පිටු. 37-42.
කුලතුංග, ටී. ජී. 1998 ***අභයගිරි විහාරය.*** කොළඹ: මධ්‍යම සංස්කෘතික අරමුදල.
කුලරත්නම්, කේ. 2000 ලංකා ඉතිහාසයේ භූවිද්‍යාත්මක සහ භූගෝලීය පසුබිම, ***ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය***, 1 කාණ්ඩය, කැලණිය: විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය, පිටු. 1-19.
කුලසූරිය, ඒ. 1961 ***සිංහල සාහිත්‍යය*** 1. මහරගම.
ගයිගර්, ඩබ්ලිව්. 2005 ***සිංහල භාෂාවේ ව්‍යාකරණය.*** කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.
ගුණතිලක, ඇම්. එච්. 1963 ***භාෂාවක විකාශනය සහ වෙස්සගිරි පුවරු ලිපිය.*** කොළඹ: සීමාසහිත කොළඹ ඇපොතිකරීස් සමාගම.
ගුණවර්ධන, ආර්. 1961 දක්ෂිණ භාරතීය ආක්‍රමණ, ***ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය***, 1 කාණ්ඩය, කැලණිය: විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය, පිටු. 112-136.
ගුණවර්ධන, පී. 2009 ***ශ්‍රී ලංකාවේ බහුජාතික එකමුතුව සහ වාස්තු විද්‍යා උරුමය.*** කොළඹ: ගොඩගේ සහ සහෝදරයෝ.
ගුණසිංහ, පී. ඒ. ටී. 1961 විදේශ සමග පැවති වාණිජ හා සංස්කෘතික සම්බන්ධතා, ***අනුරාධපුර යුගය.*** (සං.) අමරදාස ලියනගමගේ, රණවීර ගුණවර්ධන, කැලණිය: විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය, පිටු. 252-267.

ගුරුගේ, ඩබ්ලිව්. පී. ඒ. 1954 ***සිංහලය හා සංස්කෘතය.*** ලොකෝ මුද්‍රණාලය.
ජයවීර, ජේ. ඒ. ඩී. එස්. 1994 සීගිරි මැටි බඳුන්, ***සංස්කෘතික පුරාණය.*** 1 වෙළුම සීගිරිය විශේෂ කලාපය, (සං.) ටී.ජී. කුලතුංග, කොළඹ: මධ්‍යම සංස්කෘතික අරමුදල.
ජයසිංහ, සී. එන්. 1997 ශ්‍රී ලංකාවේ කාසි ක්‍රමයේ මූලික සැකැස්ම හා දුරස්ථ වෙළඳාමේ බලපෑම, ***ආර්ථික විමසුම.*** (ඔක්/නොවැ) 23වන වෙළුම, කොළඹ: පර්යේෂණ අංශය, මහජන බැංකුව, පිටු. 15-20.
ජයසුමන, සී. එස්. 2009 ***දෙමළ ජනතාවගේ සංක්ෂිප්ත ඉතිහාසය.*** බොරලැස්ගමුව: විසිදුනු ප්‍රකාශකයෝ.
ඥාණානන්ද හිමි, එම්. 1963 ***සිංහල භාෂා ඉතිහාසය.*** කොළඹ: ස්වස්තික.
**ඩයස්, එම්. 1996** *ලක්දිව සෙල්ලිපිවලින් හෙළිවන ප්‍රත්‍යාර්ථ නාමයන්ගේ විකාශනය*. **කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.**
තාපර්, ආර්. 1973 ***ඉන්දියාවේ ඉතිහාසය.*** කොළඹ: ලංකාණ්ඩුවේ මුද්‍රණාලය.
ධම්මරතන හිමි, එච්. 1970 ***දකුණු ඉන්දියාවේ බෞද්ධ ඉතිහාසය.*** කොළඹ: ගුණසේන සහ සමාගම.
ධම්මරතන හිමි, එච්. 2000 ***සිංහලයේ ද්‍රවිඩ බලපෑම්.*** නුගේගොඩ: මානවහිතවාදි ලේඛක පර්ෂදය.
**ධම්මානන්ද හිමි, එම්. 2000** *විමර්ශනාත්මක සිංහල ශිලාලිපි මාලාව*. **කොළඹ: සමයවර්ධන පුද්ගලික සමාගම.**
නිකලස්, සී. ඩබ්ලිව්. සහ ඇස්. පරණවිතාන 2004 ***ලංකා විශ්වවිද්‍යාලයේ සංක්ෂිප්ත ලංකා ඉතිහාසය*** (ආදිතම යුගයේ සිට 1505 දී පෘතුගීසින්ගේ පැමිණීම දක්වා). නුගේගොඩ: සමන් ප්‍රකාශකයෝ.
පරණවිතාන, එස්. 2000 පැරණි යුගයේ සභ්‍යත්වය: අර්ථ, දේශපාලන සහ සමාජ තත්වය, ***ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය.*** 1 කාණ්ඩය, කැලණිය: කැලණිය විශ්වවිද්‍යාලය, පිටු. 210-233.
පරණවිතාන, එස්. 2002 **ශිලාලේඛන සංග්‍රහය**. වෙළුම 4. (සං.) පරණවිතාන, කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, පිටු. 58-59.
පඤ්ඤාකිත්ති හිමි, එච්. 2003 ***කෞටිල්‍ය අර්ථශාස්ත්‍රය.*** (අනුවාදය) කොළඹ:ගොඩගේ සහ සහෝදරයෝ.
ජේමානන්ද හිමි, පී. 2004 ***සිංහල භාෂාවේ පරිණාමය හා සිදත්සඟරාව.*** කොළඹ: ගොඩගේ සහ සහෝදරයෝ.
පොන්නම්පෙරුම 1961 ***විදේශීන් දුටු පුරාණ ලංකාව.*** මහනුවර.
ප්‍රේමතිලක, පී. එල්. 2001 ***පුරාණ ඉන්දියාවේ කාසි.*** කොළඹ: ශ්‍රී ලංකා සංස්කෘතික ශාස්ත්‍රායතනය.
බණ්ඩාරනායක, එස්. 2000 ශ්‍රී ලංකාවේ පූර්ව හා මූල ඓතිහාසික අන්තර් මුහුණතෙහි ජනාවාස ස්වරූපය, ***උරුමයක ආවර්ජන.*** පළමු වන කලාපය, (සං.) ආර්.ඒ.එල්.එච්. ගුණවර්ධන, එස්. පත්මනාදන්, එම් රෝහණදීර, කොළඹ: මධ්‍යම සංස්කෘතික අරමුදල, පිටු. 1-14.
බස්නායක, එච්. ටී. 2001 ***ශ්‍රී ලංකාවේ ශිෂ්ටාචාරය 1.*** කොළඹ: ගුණසේන සහ සමාගම.
බස්නායක, එච්. ටී. 2002 ***ඉන්දියාවේ බෞද්ධ කලා ශිල්ප.*** කොළඹ: ගොඩගේ සහ සමාගම.
බෂාම්. ඒ. ඇල්. 1962 ***අසිරිමත් ඉන්දියාව.*** කොළඹ: රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව.
බුද්ධදත්ත හිමි, පී. 2000 ***හියුං සියං භ්‍රමණවෘත්තාන්තය.*** කොළඹ: රත්න ප්‍රකාශකයෝ.
බෝපෙආරච්චි, ඕ. 1997 ශ්‍රී ලංකාවේ පුරාණ කාසි, ***ආර්ථික විමසුම.*** (ඔක්/නොවැ) වෙළුම 23, කොළඹ: පර්යේෂණ අංශය, මහජන බැංකුව, පිටු. 21-25,28.
බෝපෙආරච්චි, ඕ. 2001 පුරාතන ශ්‍රී ලංකාව සහ තමිල්නාඩුව අතර තිබූ සංස්කෘතික හා වානිජ සම්බන්ධතා පිළිබඳ නව පුරාවිද්‍යා සාක්ෂ, ***ප්‍රවාද.*** අංක.18, කොළඹ: සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, පිටු.57-73.
**මුදියන්සේ, එන්. 1997** *ලංකාවේ ද්‍රවිඩ සිතිවටන*. **වැල්ලම්පිටිය: චතුර මුද්‍රණාලය.**
**රණවැල්ල, එස්. 1961 ලංකාවේ ආර්ය ජනපද පිහිටුවීම,** *අනුරාධපුර යුගය*. **(සං.) අමරදාස ලියනගමගේ, රණවීර ගුණවර්ධන, කැලණිය: විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය, පිටු. 45-59.**
**රාහුල, වී. 1965** *ලක්දිව බුදුසමයේ ඉතිහාසය*. **කොළඹ: ගොඩගේ සහ සහෝදරයෝ.**
ලයනල්, එස්. 1996 ***පැරණි ලක්දිව සිංහල දෙමළ සබඳතා.*** නුගේගොඩ: ප්‍රභාත් තරින්ද්‍රනාථ එදිරිසිංහ.
ලියනගමගේ, ඒ. සහ ආර්. ගුණවර්ධන, 1965 ***අනුරාධපුර යුගය.*** කැලණිය: විද්‍යාලංකාර විශ්වවිද්‍යාලීය මුද්‍රණාලය.
වික්‍රමගමගේ, සී. 2006 ***ශ්‍රී ලංකාවේ බෞද්ධ ප්‍රතිමා කලාව.*** කොළඹ: ගොඩගේ සහ සමාගම.
විජේසේකර, එන්. 1970 ***පැරණි සිංහල ප්‍රතිමා ශිල්පය.*** කොළඹ: ගුණසේන සහ සමාගම.
**විමලවංශ හිමි, බී. 1959** *සෙල්ලිපි සමාජය*. **කොළඹ: ඩබ්.ඩී. රත්නායක අප්පුහාමි.**
**විමලවංශ හිමි, බී. 1964** *අපේ සංස්කෘතිය*. **කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.**
වීලර්. එම්. 1971 ***ආදි ඉන්දියාව සහ පකිස්ථානය.*** කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.
වීලර්. එම්. 1971 ***පුරාණ ජනයා සහ ස්තාන අශෝක සමය දක්වා ආදි ඉන්දියාව සහ පකිස්ථානය.*** (සං.) ග්ලින් ඩැනියෙල්, කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.
සිරිසෝම, ඇම්.එච්. සහ ජී. අමරසිංහ, 1986 ***ශ්‍රී ලංකාවේ පුරාණ හස් එබූ කහාපණ.*** කොළඹ: පුරාවිද්‍යා පොර්තමේන්තව.
**සුරවීර, ඒ. වී. 1962** *අනුරාධපුර සමාජය*. **දෙමටගොඩ: සොම්සඳ මුද්‍රණාලය.**
සෝමදේව, ආර්. 1997 මුල්කාලීන ශ්‍රී ලංකාවේ අර්ථිකය (අභිලේඛනාත්මක සමීක්ෂණයක්) ***ආර්ථික විමසුම.*** (ඔක්/නොවැ) වෙළුම 23, කොළඹ: පර්යේෂණ අංශය, මහජන බැංකුව. පිටු. 8-11.
සෙනෙවිරත්න, ඒ. 1995 ***පුරාණ අනුරාධපුරය.*** කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව,
හෙට්ටිආරච්චි, ඩී. ඊ. 1961 සිංහල භාෂාව, ***ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය.*** පළමුවන කොටස, කැලණිය: විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය, පිටු. 34-41.

**ප්‍රාථමික මූලාශ්‍ර :**
**දීපවංසය** 1959 කේ. ඥාණවිමල හිමි, (සං) කොළඹ: ගුණසේන සහ සමාගම.
**ධම්පියා අටුවා ගැටපදය** 1974 ඩී.ඊ. හෙට්ටිආරච්චි, (සං) ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලය.
**මහාවංසය** 1994 පී. බුද්ධදත්ත හිමි, (සං) කොළඹ: ගුණසේන සහ සමාගම.
**රසවාහිනිය** 1899 සරණතිස්ස හිමි, 11 කොටස.
***රාජාවලිය*** 1997 ඒ. වී. සුරවීර, (සංස්). කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.
**වංසත්ථප්පකාසිනී** (මහාවංස ටීකාව) 2001 ඒ. අමරවංස හිමි, සහ එච්. දිසානායක, කොළඹ: ගොඩගේ සහ සමාගම.

**ශබ්ද කෝෂ:**

අලගියවන්න, කේ. පී. 2004 ***අලගියවන්න සංස්කෘත-සිංහල ශබ්දකෝශය.*** කොළඹ: සූරිය ප්‍රකාශකයෝ.

**ISBN 978- 955-4563- 71- 1**

**සිරි සුමංගල හිමි, එම්. 1965** *පාලි-සිංහල ශබ්ද කෝෂය*. **කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.**
**සෝරත හිමි, වී. 1952.** *ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය*. **පළමු කාණ්ඩය, කොළඹ: මහාබෝධි යන්ත්‍රාලය.**
**සෝරත හිමි, වී. 1956.** *ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය*. **දෙවන කාණ්ඩය, කොළඹ: මහාබෝධි යන්ත්‍රාලය.**
සෝරත හිමි, ඩබ්. 1952 **සුමංගල ශබ්ද කෝෂය**. කොළඹ: ගෙඩගේ සහ සහෝදරයෝ.
Williams, M.M. 1956 ***Sanskrit English Dictionary***. London: Oxford university press.
Ballard, A. 1927 ***Rulers of Indian Ocean***. London.
Basham, A.L. 1952 ***Prince Vijaya and Aryanization of Ceylon***. Ceylon Historical Journal.I.3
Begely, V. 1970 Excavations at Pomparippu, 1970, ***Ancient Ceylon***, part 1, No.4, Colombo: Department of Archaeology, pp.53-95
Begely, V. 1996 ***The Ancient Port of Arikamedu New Excavations and Researcher 1989-1992***, Vol.1, Pondicherry.
Bopearachchi.O.& D.P.M. Weerakkody. 1998 Archaeological Evidence on Changing Patterns in International Trade Relations of Ancient Sri Lanka, ***Origin, Evolution and Circulation of Foreign Coins in the Indian Ocean***.(ed) Bopearachchi. O. & D.P.M. Weerakkody,New Delhi, pp.133-178.
Bopearachchi. O. & R.M.Wickremasinhe. 1999 ***Ruhuna an ancient Civilization re visited: Numismatic and archaeological evidence on inland and maritime trade.***Colombo.
Codrington, H.W. 1924 ***Ceylon Coins and Currency***. Colombo: National Museum of Sri Lanka.
Coomaraswamy, A. K. 1927 ***History of Indian and Indonesian Art***.
Deraniyagala, S.U. 1972 The Citadel of Anuradhapura 1969: Excavation in the Gedige Area, ***Ancient Ceylon***. No. 2, Colombo: Department of Archaeology. pp.48-169.
Deraniyagala, S.U. 1984. A Classificatory System of ceramics in Sri Lanka, ***Ancient Ceylon***. No.5, Colombo: Archaeological Survey Department of Sri Lanka pp.109-114.Deraniyagala, S.U. 1992. ***The Prehistory of Sri Lanka***: ***an Ecological Perspective***. Parts 2, Colombo: Archaeological Survey Department of Sri Lanka.Dias, M. 1991 ***Epigraphical Notes***. No. 1-18.

Geiger, W. 1919 ***Maldivian Linguistic Studies***. JRASCAR Nov. (XXVII)

Geiger, W. 1938 ***A Grammar of the Sinhalese Language***. The Royal Asiatic Society Ceylon Branch, Colombo: Government Printer.

**Karunaratne, S. 1984** *Epigraphia Zeylanica*. **Vol.VII.**
**Kantawala, M.H. 1921** *Sinhalese and the Aryan Languages*. **Ceylon Antiquary and Literary Register, VII-IX.**
**Kuna, M. 1985** *Local Pottery of Anuradhapura:A way to its Classification and Chronology.*
**Muller, E.** *Ancient Inscriptions in Ceylon*. **New Dilhi: Asian Educational Service.**
**Paranavitana, S. 1933.** *Epigraphia Zeylanica*. **Vol.III.**
**Paranavitana, S. 1943.** *Epigraphia Zeylanica*. **Vol.IV.**
**Paranavitana, S. 1956** *Sigiri Graffity*.**2 Vols , Oxford University Press, London.**
**Paranavitana, S. and C.E Godakumbura 1966** *Epigraphia Zeylanica*. **Vol.V.**
**Paranavitana, S. 1970.** *Inscription of Ceylon*. **Vol.I,**
**Paranavitana, S. 1983.** *Inscription of Ceylon*. **Vol.II, Part.I .**
**Paranavitana, S. 2001.** *Inscription of Ceylon*. **Vol.II, Part.II**
Parker, H.W. 1909 ***Ancient Ceylon***. New Delhi: Asian Educational Services.
Perceival, R. 1975 ***An Account of the Island of Ceylon***. London.
Prickett, M.F. 1990 Durable Goods: The Archaeological evidence of Sri Lanka's role in the Indian Ocean Trade, ***Sri Lanka and the Silk road of the sea***. Senake Bandaranayake (ed) Colombo: Central Cultural Fund, pp.61-84.
Prickett, M.F. 1990 Mani- Mahatitha: The grate Port and Entrepot in Indian trade, ***Sri Lanka and the Silk road of the sea***. Senake Bandaranayake (ed) Colombo: Central Cultural Fund, pp.115-122.
Rathnayake, H. 1990 The Jetavana treasure, ***Sri Lanka and the Silk Road of the Sea***. Colombo: Central Cultural Fund, pp.45-61
Sankalia, T.D. 1974 ***The Prehistory and Protohistory of India and Pakistan***. Poona: Decan College, postgraduate and Research Institute.
Sukumar, S. 1951 ***A Comparative Grammar of Middle Indo-Arya***. Calcutta.
Singh, H.N. 1982 ***History and Archaeology of Black and Red ware.*** (Chalcolithic Period). Delhi: Sundeep Prakashana.
Seneviratna, S. 1984 The Archaeology of the Megalithic- Black and Red Ware Complex in Sri Lanka, ***Ancient Ceylon.*** Vol. 5. Colombo: Department of Archaeology. pp.237-295
**Taraporawala,I.J.S. 1962** *Elements of the Science of Language*.**(3rd Ed.), Calcutta.**
Wejesekare, N. 1962 ***Early Sinhalese Sculpture***. Colombo.
**Wijayaratha,D.J. 1956** *History of the Sinhalese Noun*. **Colombo.**
**Wickramasingha, D. M. De Zilva. 1912** *Epigraphia Zeylanica*. **Vol.I.**